2020 අප්‍රේල් 25 වැනිදා

හිතවත් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ සාමාජිකයිනි,

## කොවිඩ් -19 ලෝක වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලාංකික පශු වෛද්‍යවරුන්ගේ කාර්යභාරය

කොවිඩ් -19 වෛරසය සම්ප්‍රේෂණයට අදාලව සුරතල් සතුන් සම්බන්ධ වේදැයි භීතියක් හා ව්‍යාකූල බවක් අප රටේ සාමාන්‍ය මහජනයා තුල ඇතිවීමේ ප්‍රවනතාවයක් දැන් දකින්නට ඇත. මේ තත්ත්වය තවත් උග්‍ර වූයේ කොවිඩ් - 19 වෛරසය අසාදිත සුනඛයකු ගැන ආරංචියක් අද දින සුදුවැල්ල ප්‍රදේශයෙන් හමු වී ඊට ඉහල මාධ්‍ය ප්‍රචාරයක් ලැබීමත් සමගය. පශු වෛද්‍ය සංගමයේ අපි සත්ත්ව සෞඛ්‍ය භාර වෘත්තිකයන් ලෙස මේ අවස්ථාවේ ඊට ප්‍රතිචාර දැක්වීමක් ලෙස සාමාන්‍ය මහජනතාවට විද්‍යාත්මක සාක්ෂි පදනම් කර ගනිමින් ඔවුන්ගේ අවබෝධය සඳහා නිවේදනයක් නිකුත් කිරීමට මෙයින් අදහස් කරමු.

## ලෝක තත්ත්වය

හොං කොං රාජ්‍යයෙන්ද, බෙල්ජියමෙන් හා ඉතා මෑතකදී එක්සත් ජනපදයෙන්ද, බළලුන්, සුනඛයන් හා කොටියකුගෙන්ද ඉතා සීමිත කොවිඩ් - 19 අසාදන තත්ත්වයන් වාතර්‍ා විණි. මෙහිදී මද ශ්වසන ආබාධිත තත්ත්වයන් පිළිබඳව සාක්ෂි සහිතව වාතර්‍ා ඉදිරිපත් කෙරිණි. මේ හැම අවස්ථාවේදීම මෙම සතුන් කොවිඩ් - 19 අසාදිත පුද්ගලයින් හා ආශ්‍රය කර ඇති බව අනාවරණය වී ඇත. මේ වන විට ලෝක සෞඛ්‍ය සංවිධානය, සත්ත්ව සෞඛ්‍ය පිලිබඳ ජගත් සංවිධානය, ජගත් පශු වෛද්‍ය සංවිධානය, ජගත් සුරතල් සත්ත්ව පශු වෛද්‍ය සංවිධානය යන සියළුම සංවිධාන දන්වා ඇත්තේ ආශ්‍රය කරන සතුන්ගෙන් මිනිසුන්ට ඍජුවම මෙම වෛරසය අසාදනය නොවන බවයි. ගෘහාශ්‍රිත සතුන්ට අසාදිත මිනිසුන්ගෙන් බෝවීම ගැන දිගටම පයෙර්ෂණ කරන අතර ඒ වෙනුවෙන්ම කරන පයෙර්ෂණ මගින් ඉදිරියේදී මෙකී රෝග අවදානම් තත්ත්වය ගැන වඩාත් පැහැදිළි අවබෝධයකින් සාකච්ඡා කිරීමට හැකියාවක් ලැබෙනු ඇති බවට බලාපොරොත්තු තැබිය හැකිය.

## සතුන්ට වෛරසය පැතිරීම වැළැක්වීම

මෙවන් ව්‍යසනකාරී තත්වයක් තුල පශු වෛද්‍යවරුන්, සත්ත්ව සුබසාධනය හා ආරක්ෂාව උදෙසා තම සායන වල, ප්‍රජාව තුළ මෙන්ම ඉන් ඔබ්බට මහජනතාවට කරුණු පහදා දීමට මූලිකත්වය ගත යුතුය. මේ ලෝක වසංගත තත්වයේදී සත්ත්ව හිමිකරුවන් හා අනෙකුත් අයට සතුන්ගේ සුභ සාධනය සුරැකීම ගැන මෙන්ම අනෙකුත් අත්‍යවශ්‍ය කාරණා පිළිබඳව දැනුම වගකීමෙන් යුතුව සන්නිවේදනය කල යුතුය. අපගේ ප්‍රජාව තුල මෙම නව වෛරසය කුමන අකාරයේ බලපෑමක් ඇති කලද සතුන්ට ආරක්ෂාව, නිවහන, පෝෂ්‍යදායක ආහාර, පිරිසිදු ජලය, ව්‍යායාම, ආදරය හා කරුණාව දිගටම ලබා දිය යුතුය. කොවිඩ් - 19 වෛරස් ආසාදන පුද්ගලයන් වෛරස් සම්ප්‍රේෂණය අවම කිරීමට සතුන් සමග දුරස්ථ භාවය පවත්වාගැනීම, සතුන් අත පත ගෑමට පෙර හා පසු අත් සේදීම, බළලුන් ගෙවල් තුල රඳවාගැනීම, එළිමහනේ සතුන් සමග ව්‍යායාම කිරීමේදී අනිකුත් පුද්ගලයින් සමග දුරස්ථභාවය රඳවා ගැනීම, දරුණු රෝගී තත්වයකදී සතුන් රැකබලාගැනීමට "හදිසි සැලැස්මක්" සකස් කර තබාගැනීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතුය. අපගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වන අතරම සත්ත්ව සුබසාධනය හා යහ පැවැත්ම ගැන පශු වෛද්‍යවරුන් ලෙස අපහට ඇති වගකීම ගැන මෙහිදී නැවත සිහි කල යුතුය.

## විද්‍යාත්මක සාක්ෂි මත පදනම්වූ නිවේදන නිකුත්කිරීම

පශු වෛද්‍යවරුන් ලෙස මහජනතාවට, ජනමාධ්‍යයට හෝ සමාජමාධ්‍යය ජාලාවලට නිවේදන නිකුත් කල යුත්තේ විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ කරුණු ගැන පමණය. මේ වනතුරු ගෘහාශ්‍රිත සුරතල් සතුන් කොවිඩ් -19 වෛරස් ආසාදනයේ ධාරකයන් ලෙස හඳුනාගෙන නැත. වෛරසය හෙවත් ප්‍රතිදේහජනකය හඳුනාගත් පමණින්ම සතකු අසාදිත යැයි කීමට නොහැකි වන්නේ මේ අවස්ථාව හුදෙක් වෛරසය ශරීරය තුල හෝ පිටත පැවතිමක්ද විය හැකි නිසාය. තවදුරත් කරුණු පැහැදිලි කිරීමේදී අප පෙන්වා දෙන්නේ, මානව පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව(PCR)ට යොදාගන්නා ද්‍රව්‍ය හා තත්ත්ව සතුන් සඳහා වන වලංගු භාවයේ ඇති වෙනස් කම් නිසා වෛරසය හඳුනාගැනීමේ නිශ්චිතතාවයේ  නිරවද්‍යතාවයක් නැති බවය.  සැලකිය යුතු දත්ත හා විද්‍යාත්මක කරුණු වල හීනතාවයක් ඇති මෙවන් පසුබිමක ජනමාධ්‍ය හා සමාජ මාධ්‍යජාල වලට නිවේදන නිකුත් කිරීම සුදුසු නැති වන්නේ එමගින් අනවශ්‍ය භීතියක් මහජනතාව තුල ඇතිවිය හැකි නිසාය. එනිසා එවැනි නිවේදන, විශේෂයෙන් සුරතල් සතුන් පිළිබඳව නිකුත් කිරීමෙන් වලකින ලෙස අපි ඉල්ලා සිටිමු. ඔබට සැක කල හැකි සතකු හමුවුවහොත් ඒ පිළිබඳව තොරතුරු  සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට හෝ අදාල පළාත් අධ්‍යක්ෂතුමාට යොමු කිරීමට කාරුණික වන මෙන් ඉල්ලා සිටිමු. ඔබට වැඩිදුර විස්තර අවශ්‍යනම් මා ඇමතීමටද හැකිය. තොරතුරු හා දත්ත ලබා ගැනීමටත් පශු වෛද්‍යවරුන්, සුරතල් සත්ත්ව හිමිකරුවන් හා මහජනතාව දැනුවත් කිරීමට  "කේන්ද්‍රීය සන්නිවේදන මධ්‍යස්ථානයක්" ස්ථාපිත කිරිමටත් අපි කටයුතු කරගෙන යන්නෙමු.

## හිතවත් පශු වෛද්‍යවරුන් වෙත දන්වන පණිවිඩය,

ජගත් පශු දිනය යෙදෙන වෘත්තිමය වශයෙන් වැදගත් විශේෂ දිනයක් වන අද දිනයේ සියළුම පශු වෛද්‍යවරුන් එක්වී උද්ගත වී ඇති අවිනිශ්චිත හා අපැහැදිලි අදහස් හා තොරතුරු මතුවන මේ වකවානුවේ සාමාන්‍ය මහජනතාව දැනුවත් කරමින් විශේෂයෙන්ම සුරතල් හා අනිකුත් සත්ත්ව හිමිකරුවන්ගේ  අනිසි බිය නැතිකරගැනීමට උදව් කිරීමෙහිලා පෙරමුණ ගැනීමට ඔබ සැම උනන්දු කරවීමට අපි උත්සුක වන්නෙමු. මේ තීරණාත්මක මොහොතේ අපේ ප්‍රමුඛ කායර්ය හා වගකීම වන්නේ ආශ්‍රය කරන සතුන් මාගර්යෙන් සත්ත්ව හිමිකරුවන්ට කොවිඩ් - 19 වැළදීමේ අවදානමක් නැති බව දන්වා සිටීමය. ගෘහාශ්‍රිත සතුන්ගෙන් කොවිඩ් - 19 වෛරසය මිනිසුන්ට සම්ප්‍රේෂණය වීම ගැන සාක්ෂියක් මෙතෙක් ලැබී නැති නිසා මෙම සතුන් අතරමං නොකර ඔවුනගේ සුබසාධනය ආරක්ෂා කිරීම අපගේ වගකීමක් වනු ඇත.



වෛද්‍ය නිරංජලා සිල්වා

ගරු සභාපති, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමය

සම්පත් දායකත්වය
ලෝක සෞඛ්‍ය සංවිධානය
සත්ත්ව සෞඛ්‍ය පිලිබඳ ජගත් සංවිධානය
ජගත් පශු වෛද්‍ය සංගමය
ජගත් පශු වෛද්‍ය සංගමය / අප්‍රේල් මස 25 වැනිදින නිකුත් කල පුවත් පත්‍රිකාව